# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1775/22 - 2012 සැප්තැම්බර් 14 වැනි සිකුරාදා - 2012.09.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.– බී. 21/78 (VIII).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තියේ (2) වැනි උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 18 වැනි වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2012 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 1996 අංක 1 දරන විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 2012 අප්‍රේල් මස 25 වැනි දින සිට බලාත්මක වන්නේ ය.

2. 1996 පෙබරවාරි මස 09 වැනි දින අංක 909/13 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1996 අංක 1 දරන විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 9 වැනි ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එකී නියමාවලිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :–

"9. (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමණාකරන මණ්ඩලය, ආයතනයේ අධ්‍යයන හා විධායක මණ්ඩලය වශයෙන් කටයුතු කළ යුතු අතර, එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන්නේය :–

(1) පහත සඳහන් නිල බලයෙන් පත්වන සාමාජිකයන්ගෙන්, එනම් -

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) උසස් අධ්‍යාපන විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ලේකම්වරයා විසින් නම් කළ තැනැත්තෙකු ;

(ඇ) මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ලේකම්වරයා විසින් නම් කළ තැනැත්තෙකු ;

(ඈ) විද්‍යා හා තාක්ෂණ විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ලේකම්වරයා විසින් නම් කළ තැනැත්තෙකු ;

(ඉ) විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාකරනු ලබන ජාතික විද්‍යා පදනමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ඊ) ශ්‍රී ලංකා වාණිජ හා කාර්මික මණ්ඩල සංගමයේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයෙකු ;

(උ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා ;

(ඌ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විද්‍යාවන් පිළිබඳ ස්ථාවර කමිටුව මගින් නම් කරනු ලබන්නා වූ ද, (පේරාදෙණිය විශ්වවිද්‍යාලය හැර) ඉහත කී පනත යටතේ පිහිටුවනු ලැබ ඇති සියලු විශ්වවිද්‍යාලවල විද්‍යා පීඨ නියෝජනය කිරීම සඳහා, එක් පීඨාධිපතිවරයෙකු ; සහ

(2) පහත දැක්වෙන වෙනත් සාමාජිකයන්ගෙන්, එනම් –

(අ) ඉහත කී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබූ සාමාජිකයන් දෙදෙනෙකු ; සහ

(ආ) ආයතනයේ සෑම අධ්‍යයන මණ්ඩලයක් නියෝජනය කිරීම සඳහා ඒ එක් එක් අධ්‍යයන මණ්ඩලය විසින් තම සාමාජිකයන් අතුරින් තෝරා පත්කර ගනු ලබන එක් සාමාජිකයකු.".

(3) 2012 අප්‍රේල් මස 25 වැනි දින අංක 1755/33 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1996 අංක 1 දරන විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියට සිදුකරන ලද සංශෝධනය මෙයින් පරිච්චින්න කරනු ලැබේ.

09–1263

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.